මුනි සිරිපා සිඹිමින්නේ

පාඨම උපුටා ගත් ග්‍රන්ථය - දරු නැළවිල්ල හෙවත් ජාතික තොටිල්ල
- විරුවන් තනන ජාතික තොටිල්ල
එහි රචකයා - ටිබෙට් ජාතික එස් මහින්ද හිමි
රචනා කළ වෙනත් ග්‍රන්ථ - නිදහස් දැහැන, නිදහසේ මන්ත්‍රය,
ලංකා මාතා ජාතික කාව්‍ය , ළමා කවි කළඹ
මහින්ද හිමි අයත් වන සාහිත්‍ය යුගය - කොළඹ යුගය ප්‍රථම පරපුර
මෙම යුගයට අයත් වෙනත් රචකයයන් - ජී. එච් පෙරේරා, ආනන්ද රාජකරුණා, කුමාරතුංග මුනිදාස

අර්ථ විවරණය

1. මුනි සිරිපා සිඹිමින්නේ - සමනොළ ගිරි පෙදෙසින්නේ
මඳ සුළඟයි මේ එන්නේ - මගේ පුතා නිදියන්නේ

මුනි - බුදුන් වහන්සේගේ
සිරිපා - පාදයෙ සලකුණ, සටහන, ලකුණ, ලාංඡනය
සමනල ගිරි - සමනල කන්ද , ශ්‍රී පාද කන්ද

අපට හමුවන දරු නැලවිලි ගීත ගායනා කරන්නේ මව විසින් නොවේ. එහෙත් මෙහි මව දරුවා නළවන අයුරු දක්නට ලැබෙයි. මගේ පුතා යනුවෙන් ඇමතීමෙන් ම එය පැහැදිලි වෙයි. දරුවාගේ දිග නින්දට අවශ්‍ය සිසිල් සුළඟ ගෙන එන්නේ දුර ඈත සිට ය. මුනි සිරිපා සිඹිගෙන මඳ සුළඟ පුතු වෙත එයි. සමන් ගිර සිසිලස මුනි සිරිපා සිඹගෙන පැමිණෙන නිසා බුදු සුවඳත් මහා කරුණාව හා මහා ප්‍රඥා ශක්තියත් පිරී පවතියි. සමන්ගිර සිපගෙන පැමිණෙන නිසා සුළං දහරාව සිසිලස හා දීර්ඝ නින්දකට මං තනයි.

දරුවා තුළ පවත්නා පුද්ගල ශක්ති විභවය රටට නිදහස ලබා ගැනීමට හුරු කිරීම මහින්ද හිමිගේ අපේක්ෂාවයි. සමනලගිරි යන යෙදුම බාලයා තුළ දල්වන අප්‍රමාණ ශක්ති හා ප්‍රාර්තනාවන්හි විශාලත්වයත්, ඉන්ද්‍රඛීලත්වය, ගෞරවණීයත්වය, හා පූජනීයත්වය අන්තර්ගත කරයි. පද්‍යාඇසීමත් සමඟ එම සංකල්ප තමා ඉදිරියේ මැවෙයි. එබැවින් චිත්ත රූපී බස්වහරක් කවියා භාවිත කරයි. උතු ජන්දසට අයත් යොත් මත්වැල නම් සිව් පද විරිත භාවිත කරයි. මෙහි එක් පාදයක මාත්‍රා 12කි.

දේශානුරාගය, ජාතික නිදහස, ජනයාගේ සමානාත්මතාව වැනි ලක්ෂණ කෙරෙහි මහින්ද හිමියන්ගේ සුවිශේෂී ගුණාංග මෙම පද්‍ය තුළින් ද මතු කරලයි. බාලවියේදී ම මව තුළත් දරුවා තුළත් ආදර බැම්ම සමග උක්ත කරුණු මුසු කරයි. ළදරු වියේ සිට ම ශ්‍රී ලාංකිකයා තුළ ස්වදේශය ජාතික හා ආගම පිළිබඳ දැනුමත් අනුරාගය හා අභිමානයත් වඩවා ඉතිහාසය විසින් අපට ශේෂ කොට පෙන්වා දෙන ශ්‍රී විභූය ස්මරණයෙන් හෙට දවස ට තම දේශය හා ණය නැති යුතුකම් ඉටුකිරීමට මං තනයි. එබැවින් මවගේ බහුශ්‍රැත බවත් දයාවත් මතුකරන පද්‍යයකි.

2. නිදහස මහ මුහුදක් වේ - එහි උල්පත පුත නුඹ වේ
ඒ බව සිහිකොට මෙලොවේ - යුතුකම ඉටු කළ යුතු වේ

උල්පත - පටන් ගන්නා, ආරම්භක ස්ථානය, පොළවෙහි යට ඇති ජලය
බුබුළු ලෙසින් පොළොව මතුපිටට ගලා එන ස්ථානය

කවියා නිදහස මහ මුහුදට සමාන කරයි. මුහුද යනු නිදහස් සුවිසල් වූවකි. ගම්භීර වූවකි. පෘතුළ වූවකි. සම්පතකි. (මහා සම්පත් දරන බැවින් රත්නාකර වෙයි) මහින්ද හිමියෝ වචනාර්ථය ඉක්මවා ව්‍යංගාර්ථයෙන් පවසනුයේ නිදහස ඒ තරම් ම වටිනා බවකි. සුවිසල් බවකි. සයුරේ ආරම්භය උල්පතයි. එහෙත් කතුවරයා පවසන්නේ නිදහස නැමැති සාගරයයි. එහි උල්පත කුඩා දරුවායි. කුඩා දරුවා ආරක්ෂා වුවහොත් ගඟක් වී මුහුද තෙක් විශාල කළ හැකිය. නිදහස් ඒ වගකීම දරුවා වෙත පවරනුයේ මෙලෙසිනි. සැමදා කුඩා දරුවෙකුව නො සිටියි. දවසක වැඩිහිටියෙකු වෙයි. එහි දී තමා ලද කටුක ගොරහැඩි අත්දැකීම් වලින් ලත් පන්නරය යුතුකම් ඉටු කිරීමට මං පාදයි. මෙහි යුතුකම් හා වගකීම් යන දෙකම ඇතුළත් වෙයි. මෙය ද වචනයේ අර්ථ ඉක්මවා ව්‍යංගාර්ථයෙන් පවසනුයේ නිදහස ලබා ගැනීමේ පුරෝගාමී නුඹ බවත් එය යුතුකමක් මෙන් ම වගකීමක් බවත් එය මෙලොවදී ම ඉටු කළ යුතුය යනුවෙනි. පද්‍යයේ අලංකාරයට නිදහස මහ මුහුදටත්, උල්පත පුතාටත් යනුවෙන් රූපකාර්ථ දෙකක් කදිමට භාවිත කර ඇත. එක් පදයක මාත්‍රා 12 න් යුත් යොන්මත් වැල සිව්පද විරිත කවියා භාවිත කර ඇත.

3. ජාතික රණ දෙරණ මතේ - ගැටී වැටී මළ මොහොතේ
සුන්දර සුරඹුන්ගෙ අතේ - නැළවෙන බව සිතනු පුතේ

රණ දෙරණ - සටන් බිම, රණබිම, සංග්‍රාම භූමිය, යුද පිටිය
සුරඹුන් - දෙවඟනන්, දිව්‍යාංගනාවන්, සුර + අඹුවන්(පර ස්වර ලෝප සන්ධිය)
අඹ කාන්තාව, භාර්යාව, ජලය, යන අර්ථ වලට යෙදෙයි

සටන්කාමී ජවයෙන් පිඩිත මහින්ද හිමි පූර්වෝක්ත පද්‍යයේ විරිත එලෙසින්ම රැක ගෙන රිද්මය වෙනස් කරයි. මහා වැවක බැමි කටින් බුරගෙන නික්මෙන ජලස්කන්ධයක හඬක් වැනි හඬක් එවිට ඇසේයි. මුල් පදය හඬෙන් උසුරුවන කවියා නැවත හුස්ම අල්ලන්නේ දෙවන පංතියේ අන්තිම වචනෙ අගදීය. ලලිත ලසිත සේ ගයන්නට කවියා ඉඩ නොදෙයි. රණ දෙරණ යනු යුද්ධ පිටියයි. යුද පිටිය තුළ තුළ ජාතියවෙනුවෙන් ගැටී (යුද කර) මිය ගිය හොත් ඔහු දිව්‍ය අඹුවන්ගේ හෙවත් දිව්‍ය කාන්තාවන්ගේ අතේ නැළවෙන පවසයි. මෙහි ව්‍යගාර්ථය නම් ආගමත් ජාතියත් වෙනුවෙන් එය රැක ගැනීමේ අරමුණෙන් යුද කර මිය යන්නේ නම් ඔහු දිව්‍ය ලෝකයේ උපදින බවයි.

මෙහි ජාතිය යනු, ශ්‍රී ලංකා භූමියෙහි ජීවත් වීමේ උරුමකම් සහිත වසර සිය ගණනක් ජීවත් වූ ශ්‍රී ලාංකේය ජාතියයි. කවියා නැලවෙනු ඇතැයි නොකියා දැඩි අධිෂ්ඨානයෙන් පවසනුයේ නැළවෙන බව යනුවෙනි. මෙමගින් දරුවා තුළ දැඩි අධිෂ්ඨානයක් ගොඩ නගා අනාගත දේශය හා ජාතියේ අවශ්‍යතාවය සඳහා බාල කාලයේ පටන් ම නව පරපුර හැඩගැස්වීමේ අවශ්‍යතාවය කවියා තේරුම්ගෙන ඇත.

4. කරදර දහසක් හමුවි හමු වී - ඉන්ටැකි නම් සිනා වෙවී
ඔහු මෙ ලොවට පහළ දෙවී - රජෙකැයි සලකනු මැනවී.

ඉන්ටැකි - සිටින්නට හැකිවෙයි නම්, ඉන්නට පුළුවන් වුවොත්, සිටින්නට හැකි කමක් තිබෙ නම්
. ඉන්ට + හැකි = ඉන්ටැකි
දෙවි - දෙවියෙකි, දේවතාවෙකි

දේශය ස්වාධීනත්වය වෙනුවෙන් කෙරෙන පෙළඹවීමක් මෙහි පෙනෙයි. දරුවා වියපත්ව සමාජ ගතවීමේ දී අවශ්‍ය මානව ශක්තිය අවධාරණය කරන්නකි. සමාජානුයෝජනය කුසලතා උපයා දීමේ දී කෙතරම් කටුක වූ කරදර බාධක තමන් වෙත එළඹියත් ඉන් උකටලී නොවී සිනා සිසී සැහැල්ලුවෙන් සිටිය හැකි නම් ඉතා අගනේ වෙයි. එවැනි තත්ත්වයක් ලැබීම මෙලොවදී ම දේවත්වයක් ලැබීමක් වැනි යයි කවියා පවසයි. එහෙත් කරදර හමුවේ දී මිනිසා සසල වීම ස්වභාවික

බැව් කවියා දනී. ඉන්ටැකි නම් යනුවෙන් පවසනුයේ එබැවිනි. නමුදු යමෙකු අභියෝග හමුවේත් නො හඬා සිනා සිසී සිටියහොත් මේ සංකීර්ණ සමාජය හමුවේ ඔහු සත්‍ය සේම දිවියකි. දෙව්ලොව කරදර බාධා නැත. සිතූ පැතූ සම්පත් ඒවා ලබා දෙන ගස් ය. සත්තු ය. නමුත් මිනිස් ලොව එසේ නැත එහෙයින් කරදර බාධක නොසලකා සතුටින් සිටින්නා, මිනිස් ලොවට පහළ වූ දිව්‍ය රාජයෙක් වන්නේය. මහින්ද හිමි මේ කාව්‍යය තුළ ඔබා තබා ඇත්තේ ගම්භීරාර්ථ රසය ඇතිආප්ත පදයකි.

5. තමන් ලැබූ දිවි පෙවෙතේ - කොටසක් රට සමය වෙතේ
පුද නොකළොත් නුඹෙන් පුතේ - මෙලොවට කිසි පලක් නැතේ

දිවි පෙවෙතේ - ජීවිතය පවත්වාගෙන යාමේදී, ජීවත්වීමේ දී,
සමය - ආගම, තමන් අදහන විශ්වාස කරන ආගම දහම

මිනිසා සමාජය හා පරිසරය සමඟ බද්ධව පවතී. තමා තුළ ඇති දැනුමෙන් බුද්ධියෙන් ගුණ දහමෙන් සමාජය පෝෂණය කළ යුතුය. කවියා එය රටටත් ආගමටත් නිර්ලෝභීව මුදා හළ යුතු යයි යැයි පවසයි. කවියා ගැවසෙන සමාජයේ එවැනි යුතුකම් ඉටු වීම අල්ප වී ඇත. එම රික්තකය පිරවීම අනාගත පරපුරට භාර කරයි. පලක් නැති බව පෙන්වීමෙන් සඵලත්වයෙන් යුතු අනාගතයක් කවියා අපේක්ෂා කරයි. මෙලොව යනු ගෙවෙමින් සිටින ලෞකික ජීවිතයත් මෙම අනුව බාල පරපුරට වැදගත් උපදේශයක් සපයන පද්‍යයකි. මිනිසාට ජීවත් වන්නට තමන්ගේ ම යයි පැවසිය හැකි රටක් තිබිය යුතු ය. ඒ පමණක් නොව අදහන්නට ආගමක් ද අනුකූල කරගන්නට දහමක් ද තිබිය යුතුය.

6. ජාතිය රන් විමනක් වේ - ආගම මිණි පහනක් වේ
එය රැක ගන්නට මෙලොවේ - සමත් වෙතොත් පුත නුඹ වේ

විමනක් - මාලිගාවක්, මන්දිරයක්, නිවසක්, ගෙයක්
මිණිපහනක් - මැණික් ලාම්පුවක්, මැණික නැමැති ලාම්පුව, මැණික් ගල් අල්ලා ඇති පහන

ජාතිය හා ආගම යනු මිනිසා පහසුවෙන් වර්ග කළ හැකි සංස්ථා දෙකකි. මෙහි එන ජාතිය යන්න සිංහල දෙමළ ලෙස නොගෙන ශ්‍රී ලාංකේය ජාතිය ලෙස ගැනීම අගනේය. මහින්ද හිමියෝ ජාතිය රත්තරන් විමානයක් බවත් ආගම මැණික් පහණක් ලෙසත් පවසයි. එයත් අගනා රූපකාර්ථ දෙකකි. ජාතිය හා ආගම රන් හා මැණික් නම් ඒවා ඉතා අගනා වස්තු වේ. අගනා වස්තු දිවිහිමියෙන් රැක ගැනීම සිරිතයි. අද බාලයාට ඇති අභියෝගය එම අගනා වස්තු මතු දවසේ සුරක්ෂා කිරීමයි. එය කළ හැක්කේ මේ බාල ළමා පරපුරට ය. හෙට උපදින්නේ නවලොවකි. එය රැකීම පහසු වන්නේ අද සිටින වයෝවෘද්ධයාට නොව අද බාලයා ලෙසින් සිටින හෙට තරුණ වන ඔබට යනුවෙන් මහින්ද හිමි පවසයි. එලෙස ජාතිය හා ආගම ආරක්ෂා කිරීමට හැකි නම් සත්‍ය වශයෙන් ම නුබ මව් දෙරණේ පුතෙක් බව කවියා පවසයි. මෙතෙක් පද්‍යවල මෙන් අර්ථය පරිපූර්ණ පද්‍යයක් වනවා සේම රූපකාලංකාර වලින් පරිපූර්ණ පද්‍යයක් ලෙස ද මෙය පෙනෙයි.

7. ඉටු කොට කළ යුතු යුතුකම් - ලැබුණත් ලෝකෙන් ගැරහුම්
ඉවසන්නට පුළුවන් නම් - නුඹයි මගේ පුතා උතුම්

යුතුකම් - කෙනෙකු විසින් අනෙක් අය වෙනුවෙන් කළ යුතුව ඇති බවට සමාජය සලකන .දේවල්
ගැරහුම් - නින්දා අපහාස, අවලාද, නරක නාම, හෙලා තලා කතා කරනවා, හෙළා දකිනවා

මිනිසා තම පරම්පරාවට ගමට රටට ආගමට හා ජාතියට යුතුකම් ඉටු කිරීමට යාමේ දී ඉටුකළ පසුවත් එම නිසා ම නින්දා අපහාස වලට ලක් වෙයි. සමාජය සංකීර්ණ ය. එමෙන්ම භින්න රුචික ය. එම නිසාම කිසිවෙකුට සමස්ථය සතුටු කරන්නට ඉඩ නොලැබෙයි. කළ යුතු යුතුකම් ඉටු කිරීමෙන් ලැබෙන ගර්හාවත් ඉවසා දරා ගන්නට පුතුට හැකි ද ඔහු උත්තම ගණයේ පුත්‍රයෙකි. කෙටියෙන් බලතොත් යුතුකම් ඉටු කිරීමේ දී අවශ්‍යතාව ගැන පමණක් බලා කටයුතු කරන්න යනුවෙන් කවියා පවසයි. මෙය ද උපදේශයකි.

8. කාටත් හිමි පොදු දේ නම් - නැති බැරි හිඟ අවහිර කම්
මේ දේ මැඩගෙන දස්කම් - පෑම තමයි සුරුවිරු කම්

මිනිසුන්ගෙ දියුණුවේ මාවතට බාධා කරමින් පැමිණෙන පොදු ධර්මතා පවතී. එම අතර නැති බැරිකම අගහිගකම් අවහිරකම් බාධාවන් එම අතර කිහිපයකි. මෙය අටලෝ දහම ලෙස ද ගත හැකිය. එය ඉක්මවා යාමට මිනිසාට නොහැකි ය. අප ශක්තිය ලැබිය යුත්තේ එම බාදාවන් දරා ගැනීමට ය. බාධා මැඩගෙන ඉදිරියට යෑමට ය. යහපත සොයා යාම පිණිසය. එවිට ආත්ම ශක්තිය පුද්ගල පෞරුෂය වීරත්වය සමාජගත කළ හැකිය. ඒ සමඟම සමාජයට ලැබෙන්නේ සූරයෙකි. වීරයෙකි. සුරවීරයන්ගේ අඩුවක් සමාජයේ මහින්ද හිමියෝ දක්නට ඇත. එම රික්තකය පිරවීමට ළමා පරපුරෙන් අපේක්ෂා කරයි. ළමා පරපුරට දෙන උපදේශ පද්‍යයකි.

9. මිතුරුකමින් පෙරට එතොත් - දූවිල්ලක් එක්ක වුණත්
මිතුරු වෙයන් පුතේ නුඹත් - එයයි ලොවේ ගුණය මහත්

සතුරා වුව ද මිත්‍රත්වයේ දෑත් දිගුකර ඔබේ අපේක්ෂා සාදාගන්නට ඔබ වෙත ඒ නම් ඔහු පලවා හරින්නට එපා යයි මහින්ද හිමි පවසයි. කවියා මෙහි දී දූවිල්ල යොදා ගන්නේ අල්ප බවත් නිතර ම බැහැර කරන දෙයක් බවත් පෙන්වීමට ය. ***මිතුරු වෙයන් පුතේ*** යනුවෙන් කවියා බාලයා ඉදිරියේ බැගෑපත් වෙයි. එලෙස කරන්නේ දරුවාගේ පෞරුෂය වර්ධනය උදෙසා ය. පියෙකු කරන ඉල්ලීමක් ලෙස බාලයා වෙත ගෙන එයි. ලොවේ ගුණය යනු ලෝකයේ පවත්නා ස්වභාවයයි. සතුරු වෙසින් පැමිණි විට බැහැර කරමු. මිතුරු වෙසින් පැමිණි විට පිළිගනිමු. සමාජයේ ඕනෑම දෙයක් එලෙස වෙයි. (උදාහරණ වැස්ස හා අවුව අවශ්‍ය ලෙස බාර ගනිමු.)

10.සිනිඳු මොළොක් බව මලෙහී - පිරිසිදු බව පිණිබිඳු දෙහි
එක් වී මා පුතු ගෙ ළෙහි අරක් ගනී හැම දිනෙහි

සිනිඳු - මුදු, රළු හෝ ගොරෝසු නැති, ගොරහැඩි නැති, මොළොක් ,
පිණිබිඳු - වායුගෝලයේ උෂ්ණත්වය බොහෝ සෙයින් පහළ යන අවස්ථාවලදී ජල වාස්ප ඝන
. බවට පත්ව සෑදෙන ඉතා කුඩා දිය බිඳු
ළෙහි - පපුවෙහි, හදවතෙහි, ළයෙහි, හෘදයෙහි
අරක් ගනී - තැන්පත් වී රැදෙයි, දිගින් දිගටම පවතී, බැදී පවතී

සුපිරි මලෙක මෙලෙක ද එහි වර්ණය හැඩය හා සුගන්ධය ද දරුවා හොඳින් හඳුනයි. ඒ කෙරේ දරුවා සැනින් ආකර්ෂණය ද වෙයි. මලෙහි **සිනිඳු මොලොක් බව** යන්න සෞන්දර්යහි ගැබ් වන ආකර්ෂනය යනුවෙන් ද අර්ථ ගැන්විය හැකිය. එවිට සෙස්සන්ගේ ආකර්ෂණය ලැබෙන සුන්දර හදවතක් ලබා ගන්න යන අදහස දෙයි. පිනිදිය තණපත් අගට ආයෙ වතුර බිංදු ලෙසින් නොවේ. වාෂ්ප බිංදු ලෙසිනි. ඒවා එක් වී සෑදුණු පිනි ද පාරිශුද්ධත්වයෙන් හා දීප්තියෙන් ද යුක්ත ය. නොකිළිටිව බබළයි. පුතුගේ හදවත් නොකිළිටිව වැඩී යන්නා සේ කවියා දකියි. දරුවන් තුළ නරක නපුරු චෛතසික උපදිතත් ඒවා අල්පායුෂ්ක වෙයි. ඒ දරුවන්ගේ ලෝක ස්වභාවයයි. පිරිසිදු හදවත් දිගින් දිගට පවත්වා ගැනීමේ වැදගත්කම කවියා දකීයි. මේ අනුව මහින්ද හිමි දකින බාල දරුවා සුන්දර සැහැල්ලු

හදවතින් ද නොකිලිටි හදවතින් ද යුතු කරවා ගැනීම අවස්ථාවාදී නොවී අකාලික ව පැවතීම කවියාගේ දැක්මයි. **අරක් ගනී** යන්න නිතරම පැවැත්ම අවධාරණය පිණිස යෙදුමකි.

මහින්ද හිමිගේ ළමා කාලය මෙරට දේශපාලන සමාජ හා සංස්කෘතික පරාධීන යුගයකි. සිංහල විදේශිකත්වයට අධිරාජ්‍යයෙන් තැනක් නොවී ය. සිංහල බසෙත් ඉතිහාසයෙත් අඳුරු යුගයක් විය. එවැනි යුගයක නිදහස ජාතිකත්වය ජාතිකානුරාගය දේශවාත්සල්‍ය වැනි තේමා කාව්‍යයට පදනම් විය. එය යුගයේ අවශ්‍යතාවය විය. නිදහසෙ දැහැන කාව්‍ය කාර්යය සම්බන්ධයෙන් මේ හිමියෝ මතු කරන කරුණු මෙසේ ය.

මා දන්නා අලංකාර ශාස්ත්‍රයක් නැත. ඇත්තේ තැනට සුදුසු යයි මට වැටහුණු ශබ්ද සමූහයකි. රසයක් මෙහි වෙයි නම් එය විරිතෙහි පමණකි. යමක රසය විඳීමට තරම් අපට නිදහසක් කොයින් ද යනුවෙනි. බාලයා අරහයා ලියූ කවි කී මගින් දරුවා තුළ ඇති කිරීමට අපේක්ෂා කළ කරුණු ලෙස ජාතිකාභිමානය, පෞද්ගලික අභිමානය, ස්වභාව සෞන්දර්ය, සෞන්දර්ය ය. ඉතිහාසයේ ප්‍රෞඩත්වය, ජාතික සමාජ උදාරත්වය පිළිබඳ භාශෝත්පාදනය, ළමා මනස දැනුමින් පුබුදුවා අභිවර්ධනය කරවීම, රට දැය සමය පිළිබඳ වාත්සල්‍ය දනවී ම ලෙස පෙනෙයි. දරුවන් තනන ජාතික තොටිල්ල ලෙස මෙය මහින්ද හිමි නම් කරයි. මෙහි පද්‍ය 95කි.

විශේෂ සටහන්

....
....
....
....
....
....
....
....
....
....
....
....
....
....
....
....
....
....
....
....
....
....
....
....